# ශ්‍රී ලංකාවේ ජාතික නිදහස හා වාමාංශික ව්‍යාපාරය (1931-1948)

බී එච් කේ. ජනප්‍රිය මහතා
පොල්ලැව්ව, බටපොල

## ABSTRACT

1931-1948 අතර කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයට සම්බන්ධ වූ මාක්ස්වාදී වාමාංශික ව්‍යාපාරය අධිරාජ්‍ය විරෝධීව ජාතික නිදහස දිනා ගැනීම උදෙසා ක්‍රියාත්මක වීම කැපී පෙනේ. ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය විසිවන සියවස මුල් දශක තුන තුළ වඩා බලවත්ව නැගී ආවද එය අසල්වැසි ඉන්දියානු ජාතික ව්‍යාපාරය තරම් ප්‍රබල අධිරාජ්‍ය විරෝධී ජනතා බලවේගයක් නොවූයේය. මේ අතර බටහිරකරණයේ දැඩි බලපෑමට ලක් වූ ස්වදේශිය මධ්‍යම පන්තියේ ප්‍රබල කොටස බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කරමින් බ්‍රිතාන්‍ය පාලනයට පක්ෂපාතීත්වයක් දැක්වූ අතර ලෝක සංග්‍රාම දෙකේදීම අධිරාජ්‍ය බේරා ගැනීමට අනුපමේය සේවාවක් ද කළේය. ඔවුන් නිදහස දිනා ගැනීමට බලාපොරොත්තු වූයේ අධිරාජ්‍ය පාලකයන් සමඟ සුහදශීලි ලෙස කටයුතු කිරීමෙනි. වාමාංශික ව්‍යාපාරය මේ වකවානුව තුළ ලෝකයේ ඇති වූ විවිධ අධිරාජ්‍ය විරෝධී අරගල මෙන්ම නිදහස් සාමකාමී ව්‍යාපාරයන්ගේන් හා මාක්ස්වාදී ව්‍යාපාරයෙන් බලපෑම් හා ආභාෂය ලැබීය. ජාතික නිදහස දිනා ගැනීම උදෙසා වාමාංශික ව්‍යාපාරයේ කාර්ය භාරය විවිධ පැතිකඩ ඔස්සේ විහිදුනි.

තරුණ සංගම් ව්‍යාපාරය හරහා ඉදිරියට පැමිණි වාමාංශිකයෝ සූරිය මල් ව්‍යාපාරය හා සමාජ සුභ සාධන කාර්යයන්ට නැඹුරු වෙමින් අධිරාජ්‍ය විරෝධී ආකල්පයකින් ක්‍රියා කිරීම දක්නට ලැබේ. මේ ප්‍රවනතාවය තුළින් සම සමාජ පක්ෂය බිහි වීම සමඟ ජාතික නිදහස දිනා ගැනීම අරඹයා කම්කරුවන්, විරැකියාවෙන් පෙළෙනවුන්, කාන්තාවන් , තරුණයන්, නාගරික ප්‍රජාව, ගොවීන්, ආදී විවිධ සමාජ තල සංවිධාන ගත කිරීම කැපී පෙනේ. මේ සඳහා විවිධ මාධ්‍යයන් උපකාරි කරගත් සම සමාජ්‍යා කෙටි කාලයක් තුළ සීග්‍ර ජනප්‍රියත්වයක් ඇති විය. මේ නිසාම අධිරාජ්‍යවාදී බලවේග හා වාමාංශික බලවේග අතර ගැටුම් සිදුවිය. එහිදී දේශිය හා අධිරාජ්‍ය වාදි අභියෝග වලින් පන්නරය ලබමින් ඉදිරියට පැමිණි වාමාංශික නායකත්වය නිදහස් අරගලය වෙනුවෙන් සිරබත් කාමින් ඉන්දීය නිදහස් සටනට සිය දායකත්වය ලබා දෙමින් ක්‍රියාත්මක වු ආකාරය විමසීම බොහෙවින්ම කාලෝචිතය.

පසුව වාමාංශය පිල් බෙදී ගියත් මෙම බලවේගය මේ රටේ නිදහස් පියවරු බිහි කිරීමට මහා බ්‍රිතාන්‍යයට අනියම් පෙළඹවීමක් ද කර ඇත. මෙරටට සර්ව ජන ඡන්ද බලය ලැබීමත්, රටේ පැවතුණු සංස්කෘතික රටාවත්, නිසා වෙනත් අග්නිදිග ආසියානු රටවල මෙන් මෙහි අරගල පැණ නැග්ගේ නැත. එහෙත් වාමාංශික ව්‍යාපාරයේ උද්ඝෝෂණාත් වැඩ කරන ජනතාවගේ සටන් මාලාවනුත් දක්නට ලැබිණි. ප්‍රථම වරට සංවිධානාත්මක ඇති දැවැන්ත රැස්වීම් පැවැත්වූයේත් "බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදින් ඉවත්ව යනුයි"

යන සටන් පාඨය හඬ නංවමින් විසි තිස් දහස් ගණනින් විදි පෙළපාලි ගෙන ගියේත් වාමාංශික නායකත්වයේ මෙහෙයවීමෙනි. වාමාංශික ව්‍යාපාරයේ මෙම අධිරාජ්‍ය විරෝධී ක්‍රියා දාමයේ වර්ධනය සුළු කොට සැලකීමට බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය බලධාරින්ට නොහැකි විය.

මෙම ක්ෂේත්‍රයේනිලා විද්වතුන් විසින් මෙතෙක් සංක්ෂිප්තව දක්වා ඇත්තා වු හා විශේෂ අවධානය යොමු නොකරන ලද්දා වු ඇතැම් කරුණු කෙරෙහි අපගේ අවධානය යොමු කිරීමට අපේක්ෂිතයි.